**මාර්ග සංවර්ධන අධිකාරිය - 2017**

**------------------------------------------**

මාර්ග සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ13 (1) වගන්තිය හා 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරී පනතේ 16 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

## 2.1 මතය ව්‍යාවනය

**------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මාර්ග සංවර්ධන අධිකාරියට පරිපාලනමය හා මූල්‍යමය කටයුතුවල සියයට 50 කට වැඩි අයිතියක් සතු සමාගම් වන මග නැගුම කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉක්විප්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, මග නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඉමල්ෂන් ප්‍රඩක්ෂන් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සහ එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර නොතිබුණි.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගමේ අවසන් ගිණුමෙහි ඇතුලත් ව්‍යාපෘති 05 කට අදාල සහතික කල වැඩ එකතුව රු. මිලියන 23.86 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සමාගම නමින් වූ ජංගම ගිණුමෙහි ඇතුලත් කර නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගමක් ලෙස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ජංගම ගිණුම් අතර රු.මිලියන 1,380 ක වෙනසක් නිරීක්ෂණය විය. සැසඳුම් ප්‍රකාශනයක් තුලින් එම වෙනසට හේතු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර වෙනස පිළිබඳ විශ්ලේෂණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

(ඇ) සම්බන්ධිත පාර්ශව සමඟ සිදු කරන ගනුදෙනු අදාළ සමාගම් සමඟ පොදුවේ එකඟවී ඒ අනුව වර්ගීකරණය කර ගෙන නොතිබූ අතර කොන්ත්‍රාත් වලට අදාළව දෙපාර්ශවය පිළිගත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද, සමාගම විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කරන බිල්පත් සහතික කිරීමේදී සැලකිය යුතු කාල ප්‍රමාදයක් පැවතීම හේතුවෙන් ද ශේෂයන් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 5,098.97 ක් වූ යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ ශේෂයෙන් සියයට 98.9 ක්ම පූර්ණ වශයෙන් ක්ෂය වී අවසන්ව තිබුණි. මේ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හෝ 07 අනුව එකී වත්කම් ප්‍රත්‍යාගණනය කර හෝ නැවත ඇස්තමේන්තු කර ඵලදායි ජීවිත කාලය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 ජනවාරි 01 දින වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනට භාවිතා කරනු ලබන පිරිවැය රු.මිලියන 1,591.66 ක් වූ වාහන 410 ක් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර හෝ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ඇස්තමේන්තු වෙනසක් ලෙස සලකා ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) අධිකාරිය වාහන අලුත්වැඩියාව සඳහා රු.මිලියන 93.84 ක් වැය කර තිබුණ අතර මෙම වියදම තුළ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් පරිහරණය කර තිබූ වාහන අලුත්වැඩියාව සඳහා වැය කර තිබූ රු.මිලියන 4.71 ක වියදම් ද ඇතුළත්ව තිබුණි. රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාර බාහිර පාර්ශවයක් විසින් උපයෝජනය කර තිබූ වත්කම් නඩත්තුව පිළිබඳ ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) මහනැගුම මහ මැදුර ගොඩනැගිල්ලෙහි නඩත්තු කටයුතු සඳහා 2017 වර්ෂය තුළ රු.මිලියන 81.57 ක වියදමක් සිදු කර තිබුණු අතර ඉන් රු.මිලියන 3.50 ක් 2018 වර්ෂයට අදාළ ඉදිරියට ගෙවීම් වේ. එසේ වුවත්, අධිකාරිය විසින් ගෙවා තිබුණු මුළු මුදලම 2017 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම වියදම් සියල්ලම මාර්ග සංවර්ධන අධිකාරිය හා රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් පොදුවේ දරා තිබුණු බැවින්, පරිහරණය කරන ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය අනුව මෙම වියදම අධිකාරිය හා අමාත්‍යාංශය අතර විභජනය කළහොත් අධිකාරියේ වියදම රු. මිලියන 58.14 ක් හා රු.මිලියන 23.42ක් අමාත්‍යාංශයේ වියදම් වේ. මේ සම්බන්ධයෙන් ද රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 01 ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමක් සිදුකර නොතිබුණි.

(ඉ) 2018 වර්ෂයේ අධිකාරියේ වියදම් සම්බන්ධයෙන් පමණක් සිදුකළ සීමිත නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි 2017 වර්ෂයේ උපචිත වියදම් ලෙස හඳුනා නොගත් රු.මිලියන 26.4 ක් 2018 වර්ෂයේ දී ගෙවා තිබුණි. අධිකාරිය සතුව පවතින පළාත්භාර අධ්‍යක්ෂක කාර්යාල 10 ක් හා අධිවේගී මාර්ග නඩත්තු හා කළමනාකරණ ඒකකවල උපචිත වියදම් සළකා බැලුවහොත් මෙම තත්ත්වය මීට බොහෝ ඉහළ අගයක් ගනු ඇත.

(ඊ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 2,664.54 ක් පිරිවැය වූ වර්ග අඩි 252,055 ක ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ වර්ග අඩි 3,580 ක් වූ දේශන ශාලාව භාවිතයට සුදුසු තත්ත්වයක නොතිබුණි. එබැවින් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 අනුව මෙම දේශන ශාලාවේ පිරිවැය රු.මිලියන 245 ක් හා ක්ෂය රු.මිලියන 12 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(උ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණය වූ වර්ග අඩි 252,055 න් වර්ග අඩි 72,400 ක් නොහොත් මුළු වර්ග අඩි ප්‍රමාණයෙන් සියයට 29 ක් මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් පාවිච්චි කරමින් තිබුණි. රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව එම ප්‍රමාණයේ පිරිවැය වූ රු.මිලියන 496.5 ක් හා ක්ෂය රු.මිලියන 24.83 ක් සඳහා කිසිදු ගැළපීමක් ගිණුම්වලට සිදුකර නොතිබුණි.

(ඌ) ගොඩනැඟිලි පිරිවැය තුළ ඇතුලත් තෙලගපාත පොලිසිය වෙනුවෙන් රු.මිලියන 80.8 ක් වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා වාර්ෂිකව රු.මිලියන 4.04 ක් ක්ෂය ප්‍රතිපාදන සැලසුව ද ගොඩනැගිල්ලේ ඍජු ප්‍රතිලාභ මාර්ග සංවර්ධන අධිකාරිය ලබා නොගන්නා බැවින් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව මෙම ගොඩනැගිලි අධිකාරියේ වත්කම් වලින් නීත්‍යානුකූලව ඉවත් කිරීමට හා ඊට අදාල ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2017 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් වීම හෝ නොවීම පිළිබඳ නිශ්චිත තාවයක් නොතිබූ කොන්ත්‍රාත්තු 13 කට අදාල රු.මිලියන 154 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 උපදෙස්වලට පටහැනිව ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර තිබුණි.

### 2.2.4 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අඩමාණ ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන A , B හා AB ශ්‍රේණියේ මාර්ග කිලෝමීටර් 12,180 ක් පැවතිය ද ඒවායේ දිග, ප්‍රමාණය හෝ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි නිරූපණය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියේ ගෙවීම් අංශයේ, ග්‍රාමීය පාලම් අංශයේ සහ පළාත් කාර්යාලවලට අදාළව වසර 03 සිට 04 දක්වා, වසර 04 සිට 05 දක්වා සහ වසර 05 ට වැඩි ලෙස පිළිවෙලින් රු.මිලියන 174.47, රු.මිලියන 95.87 සහ රු. මිලියන 21.36 ක් වූ ප්‍රමාද දඩ මුදල් සම්බන්ධයෙන් විධිමත් සමාලෝචනයක් සිදුකර සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේශීය බැංකු ණය මඟින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති වලට අදාලව විලම්භිත වියදම් ලෙස රු.බිලියන 112 ක් හඳුනාගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද, මෙම දේශීය බැංකු අරමුදල් වලින් සිදුකළ මාර්ග සංවර්ධන හා පුනරුත්තාපන වියදම මෙලෙස විලම්භිත වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ ද රජයේ සාමාන්‍ය අයවැය ප්‍රතිපාදන මගින් අධිකාරිය විසින් දරන ලද මාර්ග සංවර්ධන හා පුනරුත්තාපන වියදම් සාමාන්‍ය වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයට ලියා හැර තිබුණි. ඒ අනුව එකම කාර්යය සම්බන්ධයෙන් මුදල් ලැබීමේ මූලාශ්‍රය මත පදනම්ව අදාල වියදම් ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති 2 ක් අනුගමනය කිරීම මතභේදයට තුඩුදෙන ගිණුම් ප්‍රතිපත්ති තෝරා ගැනීමක් විය.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට පටහැනිව අමාත්‍යාංශය හා විවිධ ව්‍යාපෘතිවල භාවිතා කරන පිරිවැය රු.මිලියන 955.88 ක් වූ වාහන 201 ක් හා එම වාහන සඳහා රු.මිලියන 177.90 ක ක්ෂය වෙන් කිරීම් අධිකාරියේ ආදායමට ලියාහැරීම නිසා මූල්‍ය ප්‍රතිඵල අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.5 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහාමාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා දේශීය බැංකු වෙතින් ලබා ගෙන ඇති ණය, වාරික හා අදාල පොලී ද සමඟ නැවත ගෙවීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා දුන් මුදල් සම්බන්ධයෙන් අධිකාරිය 2016 වර්ෂය දක්වා මුදල් පදනම මත ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. 2017 මූල්‍ය වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි උපචිත

පදනම ලෙස වෙනස් කර තිබුණි. මේ අනුව 2015 වර්ෂයේ අවසන් මාස 06 වෙනුවෙන් අදාල ණය වාරිකය හා පොලී ගෙවීම සඳහා 2016 වර්ෂයේ ජනවාරි අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මිලියන 7,795 ක් වූ මුදල 2017 මූල්‍ය ප්‍රකාශන සමඟ නැවත ප්‍රකාශ කිරීමේ දී දේශීය බැංකු ණය හා පොලී සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ආදායම ලෙස දැක්වෙන ශේෂයෙන් අඩු කර දක්වා නොතිබුණි. මේ නිසා 2016 වර්ෂය වෙනුවෙන් අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කර තිබුණු බඳු පෙර ලාභය රු. මිලියන 7,795 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත්වල උපචිත පොළිය රු.මිලියන 76.30 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ඉන් අධිකාරියේ නිලධාරීන්ගේ වැටුපෙන් අවකරණය වී සැදූමලත් ස්වයං ජීවිත රක්ෂණ අරමුදලට අදාළව ලැබිය යුතු පොළිය වූ රු.මිලියන 1.10 ක් අඩුකර තථ්‍ය පොළිය මූල්‍ය ප්‍රකශනවල දක්වා නොතිබුණි.

(ඇ) ණයගැති කාල විශ්ලේෂණයට අනුව, මුළු ණයගැති ශේෂයෙන් සියයට 26 ක් ම වර්ෂය ඉක්මවා තිබූ බැවින් සහ එහි විසිරීම අනුව අනාගත බොල්ණය වීමේ අවධානම විශ්ලේෂණය නොකර අඩමාණ ණය වෙන් කිරීම කර තිබුණි. ඒ අනුව දැනට සිදු කර ඇති රු.168,831 ක වෙන් කිරීම ප්‍රමාණවත්ව නොතිබුණි.

(ඈ) දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කාලපරිච්ඡේදය තුල ඩොලරයේ අගය ඉහල යාමෙන් විදේශ මුදල් දේශීය මුදලට පරිවර්තනයේදී අත් වූ වාසිය ප්‍රයෝජනයට ගනිමින් 2006 අප්‍රේල් 11 දිනැති අමාත්‍ය අනුමැතිය ප්‍රකාරව සිදුකරන ලද දේශීය මාර්ග පුනරුත්ථාපනය හා ආශ්‍රිත වියදම් මත දරා තිබුණු පිරිවැය රු.මිලියන 5,32.4 ක් විය. එසේ වුවත් මෙම වියදම් අධිවේගී මාර්ගයේ පිරිවැයට එකතු කර ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් අධිවේගී මාර්ගයේ පිරිවැය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබෙන අතර ඒ අනුව එහි ක්ෂය ප්‍රමාණයද රු.මිලියන 159.73 කින් අධිගණනය වී තිබුණි.

(ඉ) අධිකාරියේ 2016 මූල්‍ය ප්‍රකාශන අනුව ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 108.95 ක් වටිනා ලී බඩු හා උපකරණ මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදී තිබුණි. මෙම ලී බඩු හා උපකරණ වලින් රු. මිලියන 25.8 ක ලී බඩු අමාත්‍යාංශයට අයත් ලී බඩු බැවින් එම ලී බඩු වලට අදාල ක්ෂයවීම් හා පිරිවැය නැවත ගිණුම්වලට ගැලපිය යුතුව තිබුණ ද එසේ ගැලපීම් කර නොතිබුණි.

(ඊ) වත්කම් ලේඛනයේ සඳහන් වාහන වත්කම් ලේඛනයේ හා ඊට අදාල ගිණුම් තුල දෙවරක් සටහන් වී තිබුණු අතර එම වාහනවල පිරිවැය රු.මිලියන 25.27 ක් හා වූ ශුද්ධ අගය රු.මිලියන 11.46 ක් විය.

(උ) 2017 වර්ෂයේදී දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය මඟින් ලබාගත් පිරිවැය රු.මිලියන 112.69 ක් වූ වාහන 13 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණද, අධිකාරිය විසින් භාවිතයට යොදා තිබූ රු.මිලියන 33 ක වාහන 07 ක් ඊට අදාල ක්ෂය රු.මිලියන 4.89 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතියෙන් ලද වාහනවලට අදාළව 2017 ජනවාරි 01 දිනට ඒවායේ ආරම්භක පිරිවැය රු.මිලියන 176.62 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද මෙම ශේෂයට අදාලව ගිණුම් අංශය ලබා දී තිබූ උපලේඛණය අනුව, පිරිවැය රු.මිලියන 170.02 ක් වුයෙන් එම ආරම්භක ශේෂයන් අතර රු.මිලියන 6.60 ක වෙනසක් පැවතුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා දේශීය බැංකු ව්‍යාපෘතිය වෙතින් ලද වාහනවල ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 121.14 ක් ලෙස දක්වා තිබුණ ද, විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව එම අගය රු.මිලියන 57.64 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශන හා ගණනය කිරීම් අතර රු.මිලියන 63.50 ක වෙනසක් පැවතුණි.

(ඒ) 2012, 2013 සහ 2014 වර්ෂවල මිලට ගෙන තිබූ රු. මිලියන 112.70 ක වාහන 2017 වර්ෂයේ දී ගිණුම්වලට එකතු කර තිබූ අතර එම වාහනවලට අදාල වාහන ක්ෂය රු.මිලියන 81.81 ක් පෙර වර්ෂ ගැළපීම් ලෙස ගිණුම්වලට ගැළපීම් කර නොතිබුණි.

(ඔ) අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිමිකම් වටිනාකම රු.මිලියන 206,485 ක් වූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිමිකම් වටිනාකම රු.මිලියන 204,813 ක් විය. 2017 වර්ෂයට අදාළ සංශෝධිත විලම්භිත බදු වලට පසු ලාභය වෙනුවට, විලම්භිත බදු වලට පෙර ලාභය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට ගැලපීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ නිරූපණය කරන මුළු හිමිකම (මුළු ශුද්ධ වත්කම්) අතර රු. මිලියන 1,672 ක වෙනසක් සිදු වී තිබුණි.

(ඕ) මධ්‍යම පළාත තුළ සහ බොරැල්ල ප්‍රදේශයේ පිහිටි අධිකාරිය සතු කඩ කාමර 31 ක වටිනාකම තක්සේරු කොට මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබූ බැවින් අධිකාරියේ වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) රු.මිලියන 2 ක අතැති මුදල් ශේෂයකින් සහ රු.මිලියන 137 ක භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන ලෙස එකතුව රු.මිලියන 139 ක් ස්වයං ජීවිත රක්ෂණ අරමුදල ලෙස අධිකාරියේ මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම ප්‍රමාණය අරමුදලේ සාමාජිකයන්ට අයත් වත්කමක් වූ බැවින් ඒවා අධිකාරියේ වත්කම් ලෙස දක්වා තිබීම නිසා අධිකාරියේ වත්කම් එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

(ඛ) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව පිළිවෙළින් වසරකට අඩු, වසර එකත් හතරත් අතර හා වසර පහට වැඩි අත්තිකාරම් රු.මිලියන 698.77 ක්, රු.මිලියන 768 ක් හා රු.මිලියන 171 ක් වුව ද අයකර ගැනීමේ ප්‍රමාද කාලය සලකා මේ සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි. තවද මේ පිළිබඳව උචිත ගිණුම් ප්‍රතිපත්තියක් හෝ අය කරගැනීමේ ක්‍රමවේදයක් කළමනාකරණය විසින් පිළියෙල කර නොතිබුණි.

(ග) අධිකාරියේ ඉඩම් අංශයේ වාර්තා අනුව, අක්කර 02 රූඩ් 03 පර්චස් 27.02 ක් වූ රු.මිලියන 53.6 ක් වටිනා ඉඩම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඝ) අධිකාරියේ නීති අංශයෙන් ලද තොරතුරු අනුව, අක්කර 44 ක් වූ රු.මිලියන 210 ක වටිනාකමකින් යුතු ඉඩම් 15 ක් පිළිබඳ මිළදී ගැනීම, ඉවත් කිරීම පිළිබඳ කිසිදු සඳහනක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඞ) මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නෛතික අයිතියක් නොමැති වුව ද, බාධාවකින් තොරව භුක්ති විඳිනු ලබන ඉඩම් අක්කර 1026.54 ක් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 152 ක් වූ මිළදී ගැනීම් අත්තිකාරම්, කොන්ත්‍රාත් හා මැනුම් අත්තිකාරම් නිරවුල් නොවී පැවතීම නිසා එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් හා මූල්‍ය ප්‍රතිඵල අධිගණනය වී තිබුණි.

(ඡ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි වටිනාකම තුළ රු.මිලියන 935.7 ක ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ ඇතුළත් කර තිබීම නිසා ගොඩනැගිලි වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් හා කාර්යාල උපකරණ අඩුවෙන් දක්වා තිබුණි. මේ නිසා කාර්යාල උපකරණ ක්ෂය රු.මිලියන 154.65 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ජ) උතුරු මාර්ග සම්බන්ධතා සඳහා වූ විදේශ මූල්‍ය ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 90 ක් වැයකර ඉදිකර තිබූ නිල නිවාස 09 ක් හා කාර්යාල ගොඩනැගිලි 03 ක් 2017 වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබූ නමුත් මෙම වත්කම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ට) අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රඳවා ගත් මුදල් ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කිරීම සඳහා යොදාගත් පදනම හෙළිදරව් කර නොතිබුණි. නියැදි පරීක්ෂාවක දී අනාවරණය වූ පරිදි, අධිකාරියේ ඉදිකිරීම්වලට අදාළ බස්නාහිර පළාතේ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් කොන්ත්‍රාත් තුළින් රඳවාගත් රු.මිලියන 270.63 ක් ජංගම වගකීම් හා ජංගම නොවන වගකීම් ලෙස සමානව බෙදා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඨ) විගණනයට ඉදිරිපත් කර තිබුණු ආයෝජන උපලේඛණයට අනුව, ගොඩනැඟිලි අරමුදලින් රු.මිලියන 32 ක ආයෝජන සිදුකර තිබුණ ද එවැනි ගොඩනැඟිලි අරමුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඩ) ආපසු ගෙවිය යුතු තැන්පතු, රැඳවුම් මුදල් සහ මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් රැඳවුම් මුදල් මත අධිකාරියේ බැඳීම රු.බිලියන 3.53 ක් වූ අතර ඉන් රු.මිලියන 672 ක් ප්‍රතිමිලට ගැණුම් උපකරණ මත ආයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය වූ රු.බිලියන 2.85 ක් ප්‍රතිපාදන ඌනතාවය නිසා ආයෝජනයන් සඳහා යොදාගෙන නොතිබුණි. කෙසේවුවද, ඉහත බැඳීම් ශේෂයේ රු.මිලියන 359 ක ශේෂය වර්ෂ 5 ක් ඉක්මවා තිබුණු අතර මේ සම්බන්ධ කිසිදු ගිණුම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඪ) සේවාදායක කොන්ත්‍රාත් ඉටු කිරීම සඳහා ලබාගෙන තිබුණු සේවාදායක අත්තිකාරම් හා වෙනත් ලැබීම්වලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වගකීම් ප්‍රමාණය රු.මිලියන 2,332 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වගකීම් වෙනුවෙන් කර තිබූ ආයෝජනවල වටිනාකම රු.මිලියන 3,608 ක් ද, ජංගම ගිණුම්වල තැන්පත් රු.මිලියන 13.25 ක් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේවුවත්, මෙවැනි සුවිශේෂී අරමුදලක් පවත්වාගෙන යාම පිළිබඳ විස්තර හා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**2.2.6 අසම්භාව්‍ය බැරකම්**

-----------------------

අධිකාරියට එරෙහිව සේවකයන් විසින් පනවා තිබූ නඩුවලට අදාලව රු.මිලියන 674 ක අසම්භාව්‍ය බැරකම් පවතින බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණ ද එම බැරකම් සම්බන්ධයෙන් විශ්වාසනීය ඇස්තමේන්තු හා වෘත්තීය තක්සේරු කාලීනව සමාලෝචනය කර අදාල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.7 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති සටහනට අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකවල වැටුප් ප්‍රතිපූර්ණයන් ලෙස රු.මිලියන 108.92 ක් අයවීමට තිබූ නමුත් ව්‍යාපෘති ගිණුම්වල එවැනි බැරකම් හෙළිදරව් කර නොතිබුණි. පසුව මෙම මුදලින් රු.මිලියන 99.89 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලින් අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කළ බව විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියෙහි පිරිවැය ලෙස රු.මිලියන 116,381 ක් දක්වා තිබුණද, එදින එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව ව්‍යාපෘතියේ පිරිවැය රු.මිලියන 117,163 ක් විය. ඒ අනුව මෙකී ව්‍යාපෘතියට අදාල රු.මිලියන 782 ක වෙනසක් පැවතුණ අතර මෙම වෙනස සඳහා සැසඳීම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනට පැවති වාහනවල පිරිවැය රු.මිලියන 3,363 ක් වුව ද ඊට අදාල උපලේඛනය අනුව වාහන වල පිරිවැය රු.මිලියන 3,450 ක් බැවින් එම අගයන් අතර රු.මිලියන 87 ක නොසැසඳීමක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දේශීය බැංකු ණය ව්‍යාපෘති වර්ගීකරණය යටතේ වාහන සම්බන්ධව ක්ෂය වෙන්කිරීම් වල ආරම්භක ශේෂය, මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර රු.මිලියන 57.27 ක වෙනසක් පැවතුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දින වන විට ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දී තිබුණු මගනැගුම මහමැදුර ගොඩනැගිල්ලේ පිරිවැය රු.මිලියන 2,506 ක් බව 2017 දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු. මිලියන 2,664 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, මෙම ශේෂ දෙක අතර රු.මිලියන 158 ක වෙනසක් පැවතුණි.

(ඊ) ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හැර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සෙසු ගොඩනැගිලිවල වටිනාකම සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගය හා වත්කම් ලේඛනයේ දක්වා තිබුණු වටිනාකම අතර රු.මිලියන 55.04 ක වෙනසක් පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය බැංකු ව්‍යාපෘති සඳහා ලබාගත් ණයවලින් නොපියවූ ශේෂය හා එදිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම ණයවලට අදාල වත්කම් අතර රු.මිලියන 1,425 ක වෙනසක් පැවතුණි.

**2.2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 සැප්තැම්බර් 15 දිනැති ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙහි සඳහන් පරිදි, එම වර්ෂයේ අගෝස්තු 15 දින පැවති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව අධිකාරියේ අධිවේගී මාර්ගවලින් ලද ආදායමෙන් රු.බිලියන 04 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැරකර භාණ්ඩාගාරය ණයගැතියකු ලෙස ගිණුම්කරණය කර තිබුණි. නමුත් මෙම මුදල් නැවත අධිකාරිය වෙත අයකර ගත හැකි බවට නිශ්චිත තහවුරුවක් භාණ්ඩාගාරයෙන් ලබා දී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ ව්‍යාපෘති 05 ක් සඳහා අධිකාරිය ලබා දී තිබුණු රු.බිලියන 1.909 ක ණය/අත්තිකාරම් මුදලින් ව්‍යාපෘති 04 කට අදාළව රු.මිලියන 303.6 ක් 2018 වර්ෂය තුළ දී පියවා තිබූ බව විගණනය වෙත දන්වා තිබුණි. ඒ අනුව තවදුරටත් අයවීමට තිබූ මුදල රු.බිලියන 1.695 ක් ව පැවතුණි.

(ඇ) අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.බිලියන1.048 ක් අයවීමට තිබුණ ද එම අමාත්‍යාංශය දැනට ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ එම ණය ශේෂය අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(ඈ) සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යන ආයතනවලින් එකතුව රු.මිලියන 260.73 ක් අයවීමට තිබූ බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එවැනි වගකීමක් දක්වා නොතිබුණි.ඒ අනුව මෙම ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ද කිසියම් අවිනිශ්චිතතාවයක් පැවතුණි.

(ඉ) 2015 වර්ෂයේ දී මාතර හක්මන මාර්ග පුළුල් කිරීම් යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේදී වන්දි ගෙවීම සඳහා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත 2015 අප්‍රේල් 09 දින රු.මිලියන 29.14 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 1.37 ක මුදලක් 2016 අගෝස්තු 19 දින නැවත ලැබී තිබුණි. ඒ අනුව රු.මිලියන 27.77 ක මුදලක් තවදුරටත් ලැබිය යුතු විය. මේ වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම වී තිබුණ ද අදාළ මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## 2.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණ බැවින් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම (රු.මිලියන) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙන් ලද වත්කම් | 2,124 | ගිණුම්ගත කරන ලද වත්කම් පිළිබඳ විස්තර |
| (ආ) | මෝටර් රථ - 658 | දක්වා නොතිබුණි | වත්කම් ලේඛණය |
| (ඇ) | මෝටර් රථ - 224 | දක්වා නොතිබුණි | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේ විස්තර |
| (ඈ) | ඇප තැන්පත් | 14.7 | ඇප තැන්පත් ලේඛණය හා උපයෝගී ලියවිලි |
| (ඉ) | ගොඩනැගිලි(ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල හැර) | 1,000 (පිරිවැය) | ගොඩනැගිල්ලේ පිහිටීම, වටිනාකම, වර්ග ප්‍රමාණය යනාදී විස්තර. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | අධිවේගී මාර්ග ප්‍රාග්ධනිත කිරීම | 243,385 | අධිවේගී මාර්ග ප්‍රාග්ධනිත කිරීමට සමානව රාජ්‍ය ප්‍රදාන ලෙස සලකා කටයුතු කිරීමට අදාළ ලියවිලි. |

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ------------------------------------ | ------------------- |
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක: PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | සුබසාධන කටයුතු සඳහා මහාභාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සැපයීම සඳහා එකී අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 (iii) වගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදය. | ආපදා ණය සම්බන්ධව උපරිම සීමාව වන රු.250,000 ඉක්මවා නිලධාරීන් වෙත ආපදා ණය ලබාදී තිබුණි. අය නොවන රු.මිලියන 1.5 ක් වූ ණය ශේෂ 22 ක් පිළිබඳව චක්‍රලේඛ නියමයන්ට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) | II පරිච්ඡේදයේ 06 වන වගන්තිය | පත්කිරීම් හෝ උසස් කිරීම් සඳහා අනුගමනය කළයුතු පූර්ව කොන්දේසි සම්පූර්ණ වී ඇති බවට පත් කිරීමේ බලධරයා සෑහීමට පත්විය යුතු වුවත්, ස්ථිර නිලධාරීන් 82 කට කොන්ත්‍රාත් පදනමින් පත්වීම් ලබාදීමේ දී අදාල පූර්ව කොන්දේසි කඩවන අයුරින් කටයුතු කර තිබුණි. |
| (ii) | ii වන පරිච්ඡේදයේ 13.2 වගන්තිය | කිසියම් ධුරයක් තාවකාලිකව පුරප්පාඩු වීම එම ධුරයේ කාර්ය අවශ්‍යතාවයට හානියක් නොවන පරිදි වෙනත් නිලධාරීන් අතර බෙදා දීමට නොහැකි අවස්ථාවලදී පමණක් එම තනතුරේ වැඩ බැලීම සඳහා වෙනත් නිලධාරියකු පත් කළ හැකි වේ.අධිකාරියේ අක්කරපත්තුව ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ පුරප්පාඩු වී තිබුණු පරිපාලන සහකාර තනතුර පිරවීමට අයදුම්පත්‍ර කැඳවා සම්මුඛ පරීක්ෂණයට පවා දින නියමවී තිබියදී එම තනතුරේ වැඩ බැලීම සඳහා ලිපිකරු I ශ්‍රේණියේ නිලධාරිණියක පත්කර තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | VI වන පරිච්ඡේදයේ 04 වන වගන්තිය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 88 වගන්තිය | සෑම නිලධාරියෙකු වෙනුවෙන්ම පෞද්ගලික ලිපි ගොනුවක් අංග සම්පූර්ණව පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම සිදු කළ යුතු වුවත් අධිකාරිය එකී නියමයන්ට අනුව පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 395 | සෑම ජංගම ගිණුමකට අදාළවම මාසිකව පිළියෙල කරන බැංකු සැසඳුම් ඊළඟ මස 15 දින හෝ ඊට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අධිකාරියේ ඇතැම් අංශ හා උප කාර්යාල ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත | (i) පනතට අනුව සේවය අවසන් කරන අවස්ථාවකදී දීමනා වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවෙන් පැහැදිලි කිරීමක් ලබාගෙන නොතිබුණි.<br>(ii) පනතේ 13 වගන්තියට පටහැනිව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරීන්ට ගෙවිය යුතු පාරිතෝෂික දීමනාවෙන් රු.මිලියන 4.6 ක් අඩුකර තිබුණි. |
| (ඊ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2017 අයවැය යෝජනා අංක 373 | සියලුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කල යුතු වුවද බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය ඇතුළු තවත් ප්‍රාදේශීය කාර්යාලවල සේවක පැමිණීම හා පිටවීම සටහන් කිරීමට එම යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියට අයත් මාතර විධායක ඉංජිනේරු කාර්යාලයේ වැලිගම ගොවියාපාන ප්‍රදේශයේ රූඩ් 01 යි පර්චස් 38.4 ක් වූ භූමි ප්‍රමාණය බදු දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර බදු කුලී ගිවිසුමට එළඹීමට අධිකාරීත්වය නොතිබුණු නිලධාරියෙකු විසින් ගිවිසුමට අත්සන් කර තිබුණි.

(ආ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 (iii) වගන්තිය ප්‍රකාරව, ආපදා ණය ලබාදීමේ දී උපරිම ණය මුදල රු.250,000 කට සීමා නොකිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 549 දෙනෙකු සඳහා විධිමත් බලයකින් තොරව රු.මිලියන 64 ක් වැඩිපුර ණය වශයෙන් ලබා දී තිබුණි.

(ඇ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති අනුව සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය ප්‍රකාරව අධිවේගී මාර්ග වලින් එකතු කරගත් ගාස්තු අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, මෙම එකතු කළ ගාස්තු ජාතික මහාමාර්ග (අධිවේගී මාර්ග) සංවර්ධනය කර පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා භාවිතා කළයුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දක්වා අධිවේගී මාර්ග පද්ධතියෙන් එකතු කර තිබුණු රු.මිලියන 27,236 ක ආදායමෙන්, රු.මිලියන 13,093 ක් උක්ත ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර වියදම් සඳහා යොදා ගෙන තිබුණි.

## 3. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ බදුපෙර ලාභය රු.මිලියන 85 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු.මිලියන 7,872 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 7,787 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ආදායම රු.මිලියන 2.52 කින් අඩුවීමත් වියදම රු.මිලියන 5,720 කින් ඉහළ යාමත් මේ කෙරෙහි බලපා තිබුණි. මාර්ග නඩත්තු කිරීම හා වැඩි දියුණු කිරීම වෙනුවෙන් හා ජාතික ඉතිරි කිරීමේ බැංකු ණය වෙනුවෙන් ලද භාණ්ඩාගාර ප්‍රතිපාදන වටිනාකම රු.මිලියන 3,300 ක් වූ අතර මාර්ග නඩත්තු වැය ශීර්ෂය යටතේ වූ විලම්බිත වියදම රු.මිලියන 1,840 සහ අමාත්‍යාංශ අත්තිකාරම් රු.මිලියන 1,460 ක්ද දරා තිබීම මේ සඳහා හේතු වී තිබුණි.

## 4. කාර්යසාධනය

### 4.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 මැයි 30 දිනැති අංක PED/12/2003 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර අධිකාරියේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුව ද අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට පාලන, සැලසුම්, පුහුණු, මූල්‍ය, ඉඩම්, පර්යේෂණ සංවර්ධන සහ යාන්ත්‍රික අංශ ඇතුළත් කර නොතිබුණි.

(ආ) අධිකාරියේ ප්‍රධානම අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉටුකරනු ලබන කාර්යයන් මගින් පරිසරයට වන බලපෑම අවම කර ගැනීම සඳහා ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මෙකී ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 6,842 ක් ද, පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.මිලියන 1,452 ක් ද සහ මු.රෙ 66 හා 69 මාරු කිරීම මඟින් රු. මිලියන 2,440 ක් ද ලෙස එකතුව රු. මිලියන 10,734ක ශුද්ධ ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එයින් වියදම් කර තිබුණේ රු. මිලියන 9,211 ක් පමණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදන වලින් සියයට 14.19 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ඉතිරි වී තිබුණි.

(ඈ) 2013 සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුලදී අධිකාරියේ විෂය පථයට ගැනෙන මාර්ග කොන්ත්‍රාත් 234 ක් ද, අධිකාරියේ විෂය පථයට නොගැනෙන මාර්ග කොන්ත්‍රාත් 287 ක් ද ප්‍රදානය කර තිබුණි. 2017 වර්ෂයේ දී අධිකාරිය මාර්ග කිලෝමීටර් 126.09 ක් වෙනුවෙන් රු.මිලියන 2,155.2 ක කොන්ත්‍රාත් 75 ක් ඉටුකර තිබුණු අතර, එයින් මාර්ග 51 ක්, නොහොත් සියයට 68 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ විෂය පථයට නොගැනෙන කොන්ත්‍රාත් විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියට අයත් බොරැල්ල උමං මාර්ගයේ කඩ කාමරයක් පෞද්ගලික ව්‍යාපාරිකයෙකු වෙත 2004 නොවැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා බදු දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා බදුකරුගෙන් අයවිය යුතු රු.මිලියන 1.69 ක මුදල අයකර ගෙන නොතිබුණි. එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරියට අයත් තවත් කඩ කාමර 17 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා අයකර නොගත් බදු මුදල රු. 720,370 ක් විය.

(ආ) බොරැල්ල උමං මාර්ගයේ පිහිටි කඩකාමර හා මධ්‍යම පළාතේ කඩ කාමර බදු දීමේදී අදාල බදු කුලී ගිවිසුම්වල සඳහන් 03 වන කොන්දේසිය අනුව මාසික කුලී ගෙවීම ප්‍රමාදවිට හෝ පැහැරහැරි විට මාසික කුලියෙන් සියයට 05 ක දඩ මුදලක් අයකළ යුතු වුවද, ප්‍රමාද කාලය සැලකිල්ලට ගෙන දඩ මුදල අයකළ යුතු ආකාරය නිශ්චය කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකවරුන්ගෙන් ලද තොරතුරු අනුව අධිකාරියට අයත් අක්කර 21 කට ආසන්න වපසරියෙන් යුතු ඉඩම්වල අනවසරයෙන් පුද්ගලයින් පදිංචිව සිටියද, ඔවුන් ඒවායින් ඉවත්කර අධිකාරියේ කටයුතු සඳහා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) අධිකාරියේ විවිධ අංශයන් විසින් බදු පදනමින් ලබාගන්නා ලද ගොඩනැගිලි 13 ක් නැවත නියමිත හිමිකරුවන්ට භාරදී තිබුණ ද ඒවායේ රු.මිලියන 3.16 ක ඇප තැන්පත් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2004 වර්ෂයේ දී වත්කම් හා කොටස්වල ආයෝජනය කර තිබූ සමාගම්වලින් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ආයෝජනවලින් හැර 2017 වර්ෂය අවසානය දක්වා කිසිදු ලාභාංශයක් අධිකාරිය වෙත ලැබී නොතිබුණි.

(ඊ) 2017 වර්ෂය තුළදී නිලධාරීන් 86 දෙනකුට පාරිතෝෂික දීමනා ගෙවීම් දින 30 ඉක්මවා තිබූ අතර එම ප්‍රමාදවීම් මත අධිකාරිය විසින් අධිභාර කළ යුතුව තිබූ වටිනාකම රු.මිලියන 5.06ක් විය.

(උ) අධිකාරිය විසින් බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය සඳහා බදු පදනමින් ලබාගත් ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය 8,100 ක් බව බදු හිමියා විසින් දක්වා තිබුණද, අදාල බිම් සැලැස්මෙහි පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම ගොඩනැගිල්ල භාර ගැනීමට පෙර ගොඩනැගිල්ලේ තිබූ අඩුපාඩු බදුහිමියා ලවා පිළිසකර කරවා ගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් අංශයට අදාලව 2016 වර්ෂයේදී හා ඉන් පසුව ආරම්භ කරන ලද කොන්ත්‍රාත් 60 ක වැඩ අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් ඉක්මවා තිබුණි. එකී කොන්ත්‍රාත්කරුවන් වෙත වැඩ ආරම්භ කිරීම් සඳහා ලබාදුන් අත්තිකාරම් වලින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ ශේෂය රු. මිලියන 278.74 ක් විය. තවද මෙම කොන්ත්‍රාත්වල අත්තිකාරම් සුරක්ෂණයන්ගේ කාලය ද එදිනට ඉකුත් වී හෝ ඉකුත් වෙමින් පැවතුණි.

(ආ) ඉදිකිරීම් අංශය යටතේ ක්‍රියාත්මක කල කොන්ත්‍රාත් 04 ක් සඳහා ලබාදුන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 28.49 ක් අදාල කොන්ත්‍රාත්වලින් අඩුකර නොගෙන වෙනත් කොන්ත්‍රාත්වලින් අය කර ගැනීමට අධිකාරිය එකඟ වී තිබුණි. තවද, ප්‍රාදේශීය පාලම් ඉදිකිරීම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් 2 ක් අතරමග නවතා දමා තිබූ අතර අය නොවී පැවති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 1.4 ක් විය. ඒ අනුව අධිකාරියට අයත් එකතුව රු.මිලියන 29.89 ක් කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගැනීමට අධිකාරියේ කළමනාකාරිත්වය ඉඩ දී තිබුණි.

## 4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් නම් කරන ලද මාර්ග 64 ක් වෙනුවෙන් 2014 වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකු ණය මඟින් මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ලබාගත් රු. බිලියන 28 ක මුදලින් රු. බිලියන 6.09 ක මුදලක් වෙනත් ව්‍යාපෘති 20 ක් සඳහා යොදවා තිබුණි.

(ආ) ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය මඟින් එම ව්‍යාපෘතියේ කටයුතු සඳහා මිලදී ගෙන තිබුණු වාහනයක් අධිකාරියේ සභාපති විසින් තම පෞද්ගලික පරිහරණය සඳහා යොදවා ගෙන තිබුණි.

(ඇ) දේශීය බැංකු ණය ආධාර ව්‍යාපෘතිය යටතේ මිළදී ගත් වාහනවල පිරිවැය එක් වර්ගීකරණයක් යටතේ රු.මිලියන 51.27 ක් ලෙසත් තවත් වර්ගීකරණයක් යටතේ රු.මිලියන 44.43 ක් ලෙසත් වර්ගීකරණය කර තිබුණි.

(ඈ) බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් බදු පදනමින් ලබා ගැනීමේ දී බදු හිමියා වෙත රු.මිලියන 1.35 ක ආපසු ගෙවිය යුතු තැන්පතුවක් සහ වර්ෂයක බදු කුලියට සමාන රු.මිලියන 5.4 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ආපසු ගෙවිය යුතු තැන්පතුවක් සහ අත්තිකාරම යන දෙකම ගෙවීමේ අවශ්‍යතාවය හඳුනාගත් ආකාරය විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) 2015,2016, හා 2017 යන වර්ෂ 03 සඳහා පමණක් අධිවේගී මාර්ග වලින් එකතු වූ ආදායමින් රු.මිලියන 371 ක් ශ්‍රී ලංකා පොලීසිය වෙත විවිධ වත්කම් මිලයට ගැනීම, නිවාස බදු පදනමින් ගැනීම සහ ඉන්ධන සැපයීම වැනි කාර්යයන් වෙනුවෙන් දරා තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියට අයත් මාතර විධායක ඉංජිනේරු කාර්යාලයේ වැලිගම ගොවියාපාන ප්‍රදේශයේ රූඩ් 01 පර්චස් 38.4 ක් වූ භූමිය සඳහා වාර්ෂික බදු මුදල ගිවිසුමට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව හා බඳවා ගැනීමේ පරිපාටියෙන් පරිබාහිරව 2017 සැප්තැම්බර් 25 දිනැති අංක RDA/DG/EST දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාර නිලධාරීන් 82 ක් ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. පසුව මෙම උසස්වීම් අවලංගු කර තිබුණද, එම නිලධාරීන් වෙත අතිරේකව රු.මිලියන 3.1 ක වැටුප් සහ දීමනා ගෙවා තිබුණි.

(ඇ) බදු ලිපිගොනු අක්‍රීයව තිබූ බදුකරුවන් 25 දෙනෙකු සහ බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණු බදුකරුවන් දෙදෙනෙකු වෙත එකතුව රු.මිලියන 35.09 ක මුදලක් අධිකාරිය විසින් වර්ෂ 2014 සිට 2017 දක්වා වූ කාලය තුලදී ගෙවා තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව ඉන් රු මිලියන 13.5 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව මෙකී අවිධිමත් බදු ප්‍රතිපූර්ණය තුලින් සිදු වී තිබූ රු.මිලියන 21.59 ක පාඩුව මේ දක්වා පියවා ගෙන නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ නිලධාරින් සඳහා නිල ඇඳුම් ලබාදීම සඳහා 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා නිමි ඇඳුම් හා රෙදි සඳහා දරන ලද වියදමින් රු.මිලියන 2 කට සමාන නිමි ඇඳුම් හා රෙදි 2018 නොවැම්බර් 08 දින වන විටත් සේවකයන් අතර නොබෙදා නිශ්කාර්යව පැවතුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයේ සේවකයන් වෙත නිළ ඇඳුම් ලබාදීමෙන් පසුව එම අංශය විසින් ද නැවත නිල ඇඳුම් මිලට ගැනීම හේතුවෙන් රු. 693,050 වටිනාකමින් යුතු සුදු කමිස රෙදි හා සපත්තු අධිකාරියේ උඩමුල්ල පිහිටි ගබඩාවෙහි නිශ්කාර්යව ගබඩා කර තිබුණි.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු පිරිවැය රු.මිලියන 955.88 ක් වූ වාහන 201 ක් අමාත්‍යාංශයේ හා විවිධ ව්‍යාපෘතිවල භාවිතය සඳහා ලබා දී තිබුණි.

(ආ) අධිකාරිය විසින් අධිකාරිය සතු තවත් වාහන 37 ක් රේඛීය අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ අතර මෙම වාහනවල නඩත්තු හා අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 4.71 ක් අධිකාරිය විසින් වියදම් කර තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

බඳවා ගැනීමේ පරිපාටිය යාවත්කාලීන කර අනුමත කරවා නොගෙන සේවක පරිපාලනය සඳහා යොදවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සේවකයන් 10,407 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය සේවකයන් 10,894 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ අධ්‍යක්ෂ (පාලන) තනතුර 2017 ජූලි 20 සිට මෙම වාර්තාවේ දිනය දක්වාම පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුර පුරප්පාඩු වී තිබීම අධිකාරියේ සේවක මණ්ඩල කළමනාකරණය කෙරෙහි ඍජු බලපෑමක් ඇතිකර තිබුණ ද ඒ සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ හා අමාත්‍යාංශයේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) මහා මාර්ග නඩත්තු කටයුතු කෙරෙහි ඍජුවම සම්බන්ධ වන ස්ථිර නඩත්තු කම්කරුවන් 304 දෙනෙකුගේ පුරප්පාඩු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවතුණි.

(ඈ) තාවකාලික නඩත්තු කම්කරුවන් අනුමත කාර්ය මණ්ඩලය තුළ නොසිටිය ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එවැනි කම්කරුවන් 1,158 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඇ) අධිකාරියේ අතුරු සේවා ගණයට අයත් සහායක සේවා සඳහා සේවකයන් 2,550 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණ ද, එම සේවා ගණය සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණු කාර්ය මණ්ඩලය 2,540 ක් විය. ඒ අනුව සේවකයින් 10 දෙනෙකුගේ පුරප්පාඩු තිබිය දී සේවකයින් 94 දෙනෙකු ව්‍යාපෘති කළමනාකරණ ඒකක වෙත මුදා හැර තිබුණි.

(ඉ) ආයතනයේ කාර්ය සාධනය සඳහා හේතු වන තාක්ෂණික සේවය හා ඉංජිනේරු සේවයේ නිලධාරීන් 163 ක් පුරප්පාඩු වී තිබිය දී නිලධාරීන් 250 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකක වලට මුදා හැර තිබුණි. මෙයින් නිලධාරීන් 211 ක් ඉංජිනේරු කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් විය.

(ඊ) 2018 ජුනි 28 දිනැති අංක 2018/CL/35 දරන මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පරිපාලන චක්‍රලේඛය අනුව, ජනප්‍රිය සේවා ස්ථානයක වසර 5 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර තිබීම හා මීට පෙර ජනප්‍රිය නොවන සේවා ස්ථානයක වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර නොමැති අය ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකලද සේවයේ අවශ්‍යතාවය මත වාර්ෂික ස්ථාන මාරු කිරීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිමය කරුණක් ලෙස සලකා ස්ථාන මාරු කිරීම සිදු කරනු ලබන බව සඳහන් කර ඇති නමුත් බස්නාහිර හා සබරගමුව පළාත් අධ්‍යක්ෂ කාර්යාලවල පමණක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් වාර්ෂික ස්ථාන මාරුවීම් නොලැබ එම සේවා ස්ථානයේම අඛණ්ඩව නිලධාරින් 37 ක් සේවය කරමින් තිබුණි.

(උ) බස්නාහිර හා සබරගමුව පළාත් අධ්‍යක්ෂ කාර්යාලවල මුළු සේවක සංඛ්‍යාව 81 ක් වුව ද රාජකාරී ලැයිස්තු ලබාදී තිබුණේ සේවකයින් 38 දෙනෙකු සඳහා පමණි.

**4.9** **වාහන උපයෝජනය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් නඩත්තු කරන වත්කම් ලේඛනයේ මාර්ග සංවර්ධන අධිකාරිය නමින් වර්ගීකරණය කොට දක්වා තිබුණු වාහනවලට ඇතුලත් පිරිවැය රු.මිලියන 271 ක් වූ වාහන 19 ක් සම්බන්ධයෙන් එම වාහනවල ලියාපදිංචි අංකය, මිළදීගත් දිනය, ලැබුනේ කාගෙන් ද යන්න සඳහන් කර නොතිබුණි.

(ආ) විගණනය විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී වාහන 06 ක වර්ගය හා මාදිලිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු ලේඛන අනුව හා අධිකාරියේ වත්කම් ලේඛනය අනුව එකිනෙක නොසැසඳුනි. තවද මෙම වාහන මාර්ග සංවර්ධන අධිකාරිය නමින් ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) අධිකාරියට අයත් වාහන බව සඳහන් කරමින් ගිණුම් අංශයේ වත්කම් රෙජිස්ටරයට ඇතුළත් කර තිබූ වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු සමඟ සැසඳීමේ දී වාහන 170 ක් වෙනත් පුද්ගලයින් නමින් හෝ පෞද්ගලික ආයතන නමින් ලියාපදිංචි කර තිබූ අතර, තවත් වාහන 35 ක් අධිකාරියේ වත්කම් රෙජිස්ටරයේ දැක්වෙන නමුත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට අදාළව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිය විෂය පථයට අනුව ළඟා කරගත යුතු අරමුණු වශයෙන් තිරසර සංවර්ධන අරමුණු වන සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම, භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසාර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධන කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම සහ ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය යන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යභාරය සඳහා සහයෝගීව කටයුතු කළයුතු පාර්ශවයන් වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, නාගරික සංවර්ධන අධිකාරිය, තිරසර සංවර්ධන, වනජීවි සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය සහ නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය යන පාර්ශවයන් සමඟ ඒකාබද්ධව කටයුතු කර නොතිබුණි.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්ය සාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, අධිකාරිය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී තිබුණි.

(ඈ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා අධිකාරිය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟා වීමට සැලසුම් සකස් කිරීමේදී හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී හා දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. විගණන හා කළමනාකරණ කමිටු

---

2009 ජූනි 07 දිනැති අංක DMA/2009/01 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අනුව අවම වශයෙන් කාර්තුවකට එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පැවැත්විය යුතුව තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි. තවද, එකී රැස්වීම්වල දී ගනු ලැබූ තීරණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරමක් සිදු කර නොතිබුණි.

## 6.1 අභ්‍යන්තර විගණනය

2017 වර්ෂය සඳහා අධිකාරියේ අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව මූල්‍ය සහ කළමනාකරණ විගණනයන් යටතේ පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රධාන ඉංජිනේරු කාර්යාල සහ විධායක ඉංජිනේරු කාර්යාලවල විගණනයන් සිදු කිරීමට සැලසුම් කර තිබුණි. තවද, ප්‍රධාන ඉංජිනේරු කාර්යාල පිහිටි දිස්ත්‍රික්ක ඇස්පෝල්ට් වැඩබිම්, ගල් කඩන යන්ත්‍රාගාර පිහිටි වැඩ බිම්, දේශීය බැංකු විසින් මූල්‍යයනය කෙරෙන මාර්ග ව්‍යාපෘති ක්ෂේත්‍රගත විගණනය යටතේ ඇතුළත් කර තිබුණි. කෙසේ වුවද, ඉඩම් අත්පත් කර ගැනීම් පද්ධති විගණනයන් අධිකාරිය විසින් හිමිකාරිත්වය ඇති බවට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති මගනැගුම සමාගම් වල විගණනයන්, සී/ස එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් (පුද්ගලික) සමාගම සහ ඉදිකිරීම් ව්‍යාපෘතිවල තාක්ෂණික විගණනයන් යනාදී වැඩි අවදානමක් සහිත අංශ අභ්‍යන්තර විගණනය මඟින් ආවරණය කර නොතිබු අතර, අදාළ ක්ෂේත්‍රවල විගණන අවදානම් ප්‍රමාණය අනුව බර තැබීමක් සිදුකර නොතිබුණි. තවද, වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කිරීමේ දී ඒ පිළිබඳව අවස්ථානුකූලව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිකුත්කරන ලද මාර්ගෝපදේශ හා චක්‍රලේඛ සැලකිල්ලට ගෙන නොතිබුණි.

## 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.2.1 වත්කම් මිලට ගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය තුළ ප්‍රසම්පාදන අංශයක් ස්ථාපිත කොට තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු 47 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම ප්‍රසම්පාදනවල වටිනාකම රු.මිලියන 816 ක් පමණක් විය. ඉන් රු.මිලියන 487 ක් ඇග්‍රිගේට් සහ පෙරමුසු මිලදී ගැනීම් සහ වත්කම් මිලදී ගැනීම් ප්‍රසම්පාදනය රු.මිලියන 33.72 ක් විය. නමුත්, සමාලෝචිත වර්ෂයේ දී අධිකාරියේ අරමුදල් වලින් මිලට ගෙන තිබූ මුළු වත්කම් පිරිවැය රු. මිලියන 87.66 වුයෙන් මුළු වත්කම්වලින් ප්‍රසම්පාදන අංශයේ දායකත්වය සියයට 38.46 කට පමණක් සීමා වී තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුව තිබුණ ද සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 6.2.2 සේවා ලබා ගැනීම හා වත්කම් බදු දීමට, බදු ගැනීමට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය

මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සේවක ප්‍රවාහනය සඳහා අධිවේගී මාර්ගය ඔස්සේ සෙත්සිරිපාය සිට ගාල්ල හා මාතර දක්වා යොදවා තිබූ බස්රථ තෝරා ගැනීමේ දී පහත අඩුපාඩු සිදුව තිබුණි.

(i) අධිකාරිය විසින් තරඟකාරී මිල ගණන් ලබා ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක සහාය ද ලබා ගෙන නොතිබුණි.

(ii) මෙම ප්‍රසම්පාදනයේදී බස්රථ වලට අදාළ පිරිවිතරයන් අධිකාරිය විසින් සකස් කර නොතිබූ අතර යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු විසින් බස්රථවල යෝග්‍යතාවයන් පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 වගන්තිය ප්‍රකාරව ලංසු සුරක්ෂණ ඉදිරිපත් කළ යුතු වුවත් මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතන විසින් එවැනි ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(iv) ප්‍රවාහන සේවා ලබා ගැනීමට අදාළව මාර්ග සංවර්ධන අධිකාරිය හා සේවා සැපයුම්කාර අයතන අතර සේවා ගිවිසුම් ඇති කර ගෙන නොතිබුණි.

(ආ) කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ වැල්ලවාය (A02) මාර්ගයේ මාතර විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් වැලිගම ගොවියාපාන ප්‍රදේශයේ අධිකාරියට අයත් රූඩ් 01 පර්චස් 38.4 ක් වූ භූමි ප්‍රමාණයක් බදු දීමේදී තරඟකාරී ලංසු කැඳවීම, තාක්ෂණික ඇගයීම්, ප්‍රසම්පාදන කමිටුවක් හරහා ප්‍රසම්පාදනයන් සිදුකිරීම යනාදී නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකර 2007 මාර්තු 15 දින සිට ගොතටුව නව නගරයෙහි පදිංචි පුද්ගලයකු සමඟ කුලී ගිවිසුමකට එළඹ තිබුණි.

(ඇ) බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලය 2017 නොවැම්බර් 07 සිට අංක 32/2 පාසැල් මාවත, නාවල, රාජගිරිය යන ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලකට රැගෙන යාමට අදාල ප්‍රසම්පාදන තීරණය 2017 ඔක්තෝබර් 02 දින එක් වර්ෂයක් සඳහා ලබා දී තිබුණද මාස 22 ක් සඳහා ගිවිසුම අත්සන් කර තිබුණු අතර ගොඩනැගිල්ල කුලියට ගැනීමට අදාල පිරිවිතර සකස් කර නොතිබුණි.

## 6.2.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 55.5 ක් වූ රඳවාගත් මුදල්, කොන්ත්‍රාත්කරුවන් වෙත ආපසු නොගෙවිය යුතු බව තහවුරු කරගෙන තිබියදී එම වටිනාකම ආදායමට ලියාහැරීමට කටයුතු නොකර තවදුරටත් ගෙවිය යුතු රඳවාගත් මුදල් ලෙසම මූල්‍ය වාර්තාවල දක්වා තිබුණි. මෙයින් රු.මිලියන 55 ක් අතරමග නවතා දමන ලද ව්‍යාපෘති වෙනුවෙන් රඳවාගත් මුදල් විය.

(ආ) ඇතැම් කොන්ත්‍රාත් වලට අදාළව රු. මිලියන 6.07 ක රඳවාගත් මුදල් අදාල අඩුපාඩු නිවැරදි නොකිරීම නිසා රඳවා තබා ගන්නා ලද බව දක්වා තිබුණ ද, වසර 5 කට අධික කාලයක් මුළුල්ලේ අදාල අඩුපාඩු නිවැරදි කර ගැනීමකින් තොරව තවදුරටත් රඳවා තබා ගැනීමට කටයුතු කර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවා තබා ගන්නා ලද රු.මිලියන 683.01 ක් වූ රඳවාගත් තැන්පතු වලට අදාළ කොන්ත්‍රාත් අවසන් කර තිබුණි ද, යන්න පිළිබඳ අවධානයක් යොමු නොකර එම මුදල් කොන්ත්‍රාත්කරු ඉල්ලුම් නොකළ බව පමණක් විගණනයට වාර්තා කර තිබුණි.කෙසේ වුවද, රු. මිලියන 640.92 ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කරු ඉල්ලුම් කර ප්‍රවර්තන වර්ෂය තුලදී ගෙවා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශය හා පළාත් කාර්යාල 04 කට අදාළව වසර 03 සිට 04 දක්වා, වසර 04 සිට 05 දක්වා සහ වසර 05 ට වැඩි ලෙස පිළිවෙලින් රු.මිලියන 50.4 ක්, රු.මිලියන 28.5 ක් සහ රු.මිලියන 61.5 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු පැවති අතර අදාළ කාර්යය නිම වූ පසු හෝ කාලය ඉකුත් වූ පසු ආපසු නොගෙවා අධිකාරිය විසින් රඳවා තබා ගෙන තිබු අතර නිසි පසුවිපරම් කිරීමක් හා අධීක්ෂණයක් නොකර එලෙස රඳවාගෙන තිබුණි.

### 6.2.4 මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් වලට අදාළ කාර්ය සාධනය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුළ සහ ඊට පෙර වර්ෂ තුළ දී ආරම්භ කර 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 4,332.88 ක් වූ කොන්ත්‍රාත් 181 ක වැඩ සමාලෝචිත වර්ෂය තුළදී ද ආරම්භ කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු වූ කොන්ත්‍රාත් සංඛ්‍යාව 110 ක් වූ අතර ඒවායේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 6,053.33 ක් විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ප්‍රගතිය සියයට 50 ත් සියයට 100 ක් අතර වූ කොන්ත්‍රාත් සංඛ්‍යාව 178 ක් වූ අතර ඒවායේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 8,807.95 ක් විය. එම කොන්ත්‍රාත් වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට දරා තිබූ වියදමෙහි එකතුව රු.මිලියන 1,224.6 ක් විය.

(ඈ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කොන්ත්‍රාත් 27 ක් එම වර්ෂය තුළදීම අවසන් කර තිබුණි. සියයට 100 ක් ම වැඩ අවසන් කර ඇති කොන්ත්‍රාත් සංඛ්‍යාව ඉලක්කගත මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාවෙන් සියයට 3.1 කි. එකී ව්‍යාපෘති 27 හි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,468 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට එකී කොන්ත්‍රාත් වෙනුවෙන් දරා තිබූ මුළු වියදම රු.මිලියන 962.35 ක් විය.

### 6.2.5 දේශීය බැංකු විසින් මූල්‍යනය කෙරෙන ව්‍යාපෘති හා අධිවේගී මාර්ග ව්‍යාපෘති

---

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2018 ජුලි 30 දිනට දේශීය බැංකු මගින් ලබාගෙන නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 214,262 ක් විය. මෙම ණය ප්‍රධාන දේශීය වාණිජ බැංකු 07 කින් හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් මහාමාර්ග වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම, අධිවේගී මාර්ග ඉදිකිරීම හා ඉඩම් අත්පත් කර ගැනීමේදී වන්දි ගෙවීම වැනි කටයුතු සඳහා ලබාගෙන තිබුණි.

දිවයින පුරා කිලෝමීටර 1433.85 ක දිගින් යුත් ප්‍රමුඛතා මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකු වලින් රු.බිලියන 152 ක් වූ ණය මුදල් අධිකාරිය වෙත ලබාගැනීමට අමාත්‍ය මණ්ඩලය වෙතින් අධිකාරීත්වය ලැබී තිබුණි. ඒ අනුව, එම මාර්ග 64 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු. බිලියන 152 ක් වටිනා කොන්ත්‍රාත් අධිකාරිය විසින් ප්‍රදානය කර තිබුණි.

මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම ව්‍යාපෘතියට අදාල මාර්ග 64 න් මාර්ග 28 ක් ඉදිකිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග ගිවිසුම්ගත වූ ණය මුදල රු.මිලියන 55,392 ක් විය. මෙම මුදලින් 2014 දෙසැම්බර් වනවිට රු.මිලියන 28,000 ක් ණය ගිවිසුමට පටහැනිව වෙනත් කාර්යයන්ට යෙදවීම සඳහා ලබාගෙන තිබුණි. ඉහතින් සඳහන් කළ ණය ගිවිසුමට පටහැනිව ලබාගත් රු.මිලියන 28,000 ක මුදල අධිකාරියේ, එවකට පැවති වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වෙනත් විදේශ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල මාර්ග ඉදිකිරීම්කටයුතු, පරිපාලන වියදම් සහ වෙනත් කටයුතු සඳහා භාවිතා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම මාර්ගවල අපේක්ෂිත කාර්යය සාධනය ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. තවද ව්‍යාපෘති 06 ක වැඩ 2017 දෙසැම්බර් 31 වනවිට ද නිම කර නොතිබුණි.

(ආ) රු.මිලියන 28,000 ක් වූ අමතර වියදම් ආවරණය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2015 වර්ෂයේ රු.මිලියන 5,400 ක් ද 2016 වර්ෂයේ රු.මිලියන 6,250 ක් සහ 2017 වර්ෂයේ රු.මිලියන 3,300 ක් වශයෙන් එකතුව රු.මිලියන 14,950 ක් භාණ්ඩාගාරය වෙතින් ලබාගෙන තිබුණි. කෙසේ වුවද, ඉදිකිරීමට යෝජිත මාර්ග ඉදිකිරීම් කටයුතු, මාර්ගවල දිග,පළල , කොන්ක්‍රීට් කාණු පද්ධති, බෝක්කු, පැතිබැම් සහ මාර්ගයේ මතුපිට ස්ථරයේ ඉදිකිරීම් යනාදී ඇතැම් වැඩ අයිතමයන්ගේ විෂය පථය මුලින් සැලසුම් කර තිබූ ආකාරයට වඩා අඩුවෙන් ඉටුකර තිබුණි.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මඩකලපුව - තිරික්කොන්ඩායි ආරු - ත්‍රිකුණාමලය (A-15) සහ අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A-6) මාර්ග, ත්‍රිකුණාමලය නගරයෙන් පිටත සම්බන්ධ වනසේ ඉදිකරන ලද පිටත වටරවුම් මාර්ගය සඳහා එක්සත් රාජධානියේ වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ 2009 සහ 2010 වසරවලදී රු.මිලියන 3,495 ක් වැයකර පාලම් 08 ක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, 2018 මැයි 31 දින වන විට වසර 7 ක් ගත වී ඇතත් මාර්ගය ඉදිකිරීම සඳහා අරමුදල් නොමැතිවීම හේතුවෙන් මෙම පාලම් සම්බන්ධ කෙරෙන මාර්ග ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය මඟින් පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම මාර්ගය පුනරුත්ථාපනය සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් රු.මිලියන 2,172 ක ණයක් ලබා ගෙන තිබුණි. මෙම මාර්ගය පුනරුත්ථාපනයේදී කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන ලද විචලන නියෝග 01 ට අනුව රු.මිලියන 18 ක් ඇඹිලිපිටිය පිහිටි ජනාධිපති මන්දිරයට අදාල ඉදිකිරීම් පිරිවැය ලෙස දක්වා තිබුණි.

(ඇ) ගලිගමුව රුවන්වැල්ල කරවනැල්ල මාර්ගයේ පවතින පටු සහ අබලන් පාලම් 07 ක් පිළිබඳව විගණනය විසින් පෙන්වා දී තිබුණ ද, 2018 ජූලි 31 දින වන විටත් එම පාලම්වලින් පාලම් 06 ක් ම 2018 ඔක්තෝබර් මාසය අවසානය වන විටත් ප්‍රතිසංස්කරණයට ලක්කර නොතිබුණි.

## 6.4 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී තිබූ විධානයන් ක්‍රියාත්මක නොකිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මගනැගුම සමාගම්වල කොටස් වලින් වැඩි ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරය වෙත හිමිවන අයුරින් හා ඉතිරිය මාර්ග සංවර්ධන අධිකාරියට ලැබෙන පරිදි මගනැගුම සමාගම් තුනෙහි සාංගමික ව්‍යවස්ථාවලින් සංශෝධනය කරවීමට විධානය කර තිබුණ ද, මෙම විධානය අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 අගෝස්තු 10 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉහත සමාගම්වලට අදාළව ලබා දී තිබූ පහත විධානයන්, 2017 නොවැම්බර් අග දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ සහ ඉමල්ෂන් නිෂ්පාදන සමාගමේ අයිතිය අධිකාරිය වෙත ලබා ගැනීම.

(ii) මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගමේ 2004 ජුනි 05 දින සිදුකල රු. 1,000,000 ක ස්කන්ධ ආයෝජනය සඳහා කොටස් සහතික 2018 දෙසැම්බර් 31 දිනටත් නිකුත් කිරීම.

(iii) ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් කටයුතු සඳහා අධිකාරිය සතු වත්කම් භාවිතා කිරීමට ඉඩ දෙමින් සහ සියයට 28 ක අලාභයක් ද දරමින් අධිකාරිය විසින් සමාගම්වලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගැනීම.

(ඈ) 2017 සැප්තැම්බර් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ රැස්වීමේ දී අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියක් මාස 03 ක් තුළ සකස් කිරීමට නියෝග කර තිබුණ ද, මෙම වාර්තාවේ දිනය දක්වා එම නියෝගය අනුව කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ඉන්වොයිස් නිකුත් කිරීම | ඉන්වොයිස් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා කාලීනව ගිවිසුම් ප්‍රකාරව සිදු කර නොතිබීම. |
| (ආ) | වත්කම් උපයෝජනය | ඉඩම්, ගොඩනැගිලි වාහන ඇතුළු වත්කම් පිළිබඳ වාර්ථාකරණය, උපයෝජනය හා පාලනය නීතිරීති, රෙගුලාසිවලට අනුකූලව හා මනා පාලනයකින් තොරව සිදුකර තිබීම. |
| (ඇ) | ගෙවීම් අංශයේ කටයුතු | ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම හා ගෙවීමක් කිරීමේ දී එම ගෙවීමේ නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට අදාළ මූලික ලියවිලි පිළිබඳ අවධානය යොමුකිරීම. |
| (ඈ) | අත්තිකාරම් පියවීම | විධිමත්ව හා කාලීනව සිදු නොවීම. |
| (ඉ) | ගිණුම්කරණය | වියදම් ප්‍රභවය හා සම්බන්ධ කේවල ගිණුමක් නඩත්තු නොවීම, උචිත ගිණුම් ප්‍රතිපත්ති හඳුන්වා නොදීම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිවලට අනුගත නොවීම. ගිණුම්කරණ අඩුපාඩු කෙරෙහි දැඩි අවධානය. |
| (ඊ) | එකතු කළ අගය මත බදු ගෙවීම් | එකතු කළ අගය මත බදු ගෙවීමේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තත්කාලීනව ලියාපදිංචියේ වලංගුතාවය සලකා බැලීම. |
| (උ) | කාර්ය මණ්ඩලය කළමනාකරණය | පෞද්ගලික ලිපිගොනුකරණය, අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීම, ස්ථාන මාරු ක්‍රියාවලිය විධිමත් කිරීම. |
| (ඌ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදනයේ වාසි ප්‍රසම්පාදනය අස්ථිත්වයට ලබාගැනීමට කටයුතු කිරීම. ප්‍රගතිය සමාලෝචනය හා හැකි සෑම විටම මධ්‍යගත ප්‍රසම්පාදනයට යොමු වීම. |